# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2017/51 - 2017 මැයි මස 05 වැනි සිකුරාදා - 2017.05.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

MP/2812

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම යටතේ ඉදිකෙරෙන කැස්බෑව භූගත ජලාශයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1269.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 572 A කැස්බෑව දකුණ ග්‍රාම නිලධාරි වසමේ දෙමලදූව ගමේ පිහිටි මාරගහවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 19.2 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | වෛද්‍ය ඩෙන්සිල් පිරිස්ට අයිති ඉඩම වෙන් වෙන අඩි 3 ක් පළල කාණුව ; |
| *නැගෙනහිරට* | : | කනන්නොරුව වත්ත වෙන් වෙන අඩි 3 ක් පළල කාණුව ; |
| *දකුණට* | : | කනන්නොරුව වත්ත ඉඩමේ කොටස ; |
| *බටහිරට* | : | කැස්බෑව බණ්ඩාරගම ප්‍රධාන මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. රුවන් පෙරේරා මයා,
අංක : 69,
ශ්‍රී දේවානන්ද පාර,
කුම්බෝවිල,
පිළියන්දල.

05 - 617

1A - G 25532 — 40 (2017/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

MP/2516

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘති අදියර II යටතේ කෙසෙල්වත්ත භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1266.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 670 හොරේතුඩුව ග්‍රාම නිලධාරී වසමේ හොරේතුඩුව ගමේ පිහිටි පොකුණවත්ත නොහොත් තෙල්දෙනවත්ත නොහොත් ගංගාරාම විහාරස්ථාන වත්ත නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණ වන බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන මිය විසින් 2016.06.22 දින සකස් කර ඇති අංක : 2016/W 08 පිඹුරේ කැබලි අංක : 1 ලෙස දැක්වෙන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

01. කැබලි අංක : 01 - ඉඩමේ නම : පොකුණවත්ත නොහොත් තෙල්දෙනවත්ත නොහොත් ගංගාරාම විහාරස්ථාන වත්ත ප්‍රමාණය : පර්චස් 20 ක් පමණ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | වරිපනම් අංක 18 දරන මාදන්ගහවත්ත ඉඩම සහ චන්ද්‍රසේකර පටුමග ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ඉඩම ; |
| *දකුණට* | : | ගංගාරාම විහාරස්ථානයේ සිට ගාලු පාර දක්වා වූ මාර්ගය ; |
| *බටහිරට* | : | වරිපනම් අංක 620 දරන පොකුණවත්ත නොහොත් තෙල්දෙනවත්ත නොහොත් ගංගාරාම විහාරස්ථාන වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

01. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

02. ගරු විහාරාධිපති,
ගංගාරාම විහාරස්ථානය,
හොරේතුඩුව,
මොරටුව.

05 - 618

---

MP/2846

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ පිච්චමල් වත්ත සේවා ජලාශයේ හා පොම්පාගාරයේ නළ එලීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1279.

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 278 ගුරුදෙනිය බටහිර ග්‍රාම නිලධාරි වසමේ කිරිමැටිය ගමේ පිහිටි වෙට්ටියවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 12.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | තැන්නේකුඹුර, රිකිල්ලගස්කඩ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | අධ්‍යාපන සංවර්ධන පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය හා එහි ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 04 ; |
| *බටහිරට* | : | අධ්‍යාපන සංවර්ධන පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයට අයත් ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* සොයාගත නොහැක.

05 - 619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.